1st Place Winner
National Productivity
Award 2020

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය / எமது இல. / My Ref. CSS/03/06/04/ANN.TR/2026 ඔබේ අංකය / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2026.10.12

ආණ්ඩුකාර ලේකම්, සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

## වාර්ෂික ස්ථාන මාරු - 2026

**දකුණු පළාත් ප්‍රධාන ලේකම් වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම**

2026 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද 2026.03.16 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛ අංක 01/2026 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. ඒ අනුව, දකුණු පළාත් සභාවේ සංවර්ධන නිලධාරී / කළමනාකරණ සේවා නිලධාරී / තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර / රියදුරු / කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිලධාරීන් සම්බන්ධයෙන් 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ තීරණ මේ සමඟ අමුණා ඇති අතර, එම තීරණ ප්‍රධාන ලේකම් නිල වෙබ් අඩවියට (**www.cs.sp.gov.lk**) මුදා හැර ඇති බව කාරුණිකව දන්වමි.

03. 2026 වාර්ෂික ස්ථාන මාරු යටතේ, අභියාචනා මණ්ඩල තීරණ මගින් අවලංගු කරන ලද ස්ථාන මාරුවීම් හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා යොමු කරන ලද නිලධාරීන් ඇතුළත් ස්ථාන මාරු නියෝග හැර, ක්‍රියාත්මක වන දිනය දීර්ඝ කරන ලද ස්ථාන මාරුවීම් අදාළ දිනට ක්‍රියාත්මක කරන ලෙසත්, අනෙකුත් සියලු ස්ථාන මාරුවීම් **2026.10.19** දිනට ක්‍රියාත්මක කරන ලෙසත් **මෙයින් නියෝග කරමි.**

04. එසේම, ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දින වන විට ප්‍රසූත නිවාඩු ලබා ඇති නිලධාරිනියන්ගේ ස්ථාන මාරුවීම් ප්‍රසූත නිවාඩු අවසන්ව පැමිණි දිනට සති 02 කට පසු ක්‍රියාත්මක කළ යුතු ය.

05. ඒ අනුව, ස්ථාන මාරුවීම් ලබා ඇති කිසිදු නිලධාරියෙකු නියමිත දිනයෙන් පසුව නිදහස් නොකොට රඳවා නොගත යුතු අතර, අනුප්‍රාප්තික නිලධාරීන් පැමිණෙන තෙක් ඔවුන් රඳවා නොගෙන නව සේවා ස්ථානයන්හි රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි ඔවුන් සේවයෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතුය.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2222603
කාර්යාලය / அலுவலகம் / Office 091 4119011, 091 2234052
091 2246299
chiefsec1@sltnet.lk
www.cs.sp.gov.lk
එස්.එච්. දහනායක මාවත, ගාල්ල. S.H. Dahanayaka Mawatha, Galle. எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

06. එකී ස්ථාන මාරු වී යන නිලධාරින්ගේ රාජකාරි, ආයතන ප්‍රධානියා හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් නම් කරන නිලධාරියෙකුට භාර දී, නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන පරිදි අදාළ නිලධාරීන් සේවයෙන් නිදහස් කිරීම ඔබගේ වගකීම වන බව අවධාරණය කරන අතර, **නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්තිය ප්‍රකාරව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බවද දන්වමි.**

07. එමෙන්ම, නියමිත දිනයේදී ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක නොකිරීම මත ඇතිවන ගැටළු සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් පෞද්ගලිකව වගකිව යුතු බව මින් අවධාරණය කරන අතර, **නියමිත දිනයේදී නව සේවා ස්ථානයට වාර්තා නොකරන නිලධාරීන්ගේ වැටුප් හා සියලු දීමනා ගෙවීම නතර කිරීමට පියවර ගන්නා ලෙස ද මින් නියෝග කරමි.**

08. එසේම, මා විසින් නිකුත් කරන ලද අංක 01/2026 හා 2026.03.16 දිනැති ප්‍රධාන ලේකම් පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, මෙම 2026 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ තීරණවල මුද්‍රිත පිටපත් දකුණු පළාත් සභාවේ සියලු ආයතන වෙත යොමු නොකරන බව කාරුණිකව දන්වා සිටිමි.

09. එබැවින් ඔබ අමාත්‍යාංශයට / දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියලුම ආයතන වල නිලධාරීන් වෙත ද, 2026 වාර්ෂික ස්ථාන මාරු වීම් යටතේ, ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ තීරණ නොපමාව දැනුම් දීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

**චන්දිම සී. මුහන්දිරම්ගේ**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත**

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් :

01. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන උප කාර්යාලය - දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - 2026 වාර්ෂික ස්ථාන මාරු ප්‍රගතිය මසක් ඇතුළත මා වෙත දැනුම් දීමට / අ.ක.ස.